# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

## නිෂ්පාදන සහ සේවා



**2023 මැයි මාසයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් ද නිෂ්පාදන ක්‍රියාකාරකම්වල පහත වැටීමක් ද පෙන්නුම් කරන ලදී.**

**නිෂ්පාදන ක්‍රියාකාරකම්හි පසු බෑමක් පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2023 මැයි මාසයේ දී ඉකුත් මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වුවද පහළ යන ලදී.** ඒ අනුව, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2023 මැයි මාසයේ දී 46.2ක අගයක් වාර්තා කළ අතර , මේ සඳහා සියලුම උප-දර්ශකයන්ගේ පහළ යෑම හේතු විය.


**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

**46.2**

**2023 මැයි**

නිෂ්පාදන සහ නව ඇණවුම් පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ පසුබැසීම හේතු විය. සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දැක්වූවන්ට අනුව, සෑම වසරකම උත්සව සමයෙන් පසු සිදුවන ඉල්ලුමේ අඩු වීම මෙන්ම, පාරිභෝගිකයින්ගේ මිලදී ගැනීමේ හැකියාව පිරිහී තිබීම මේ සඳහා හේතු විය. තවද, රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන අංශය සඳහා ලැබුණු ඇණවුම් අප්‍රේල් මාසයේදී වාර්තා වූ පහළ මට්ටමේම පැවති අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් ගෝලීය ඉල්ලුම අඩුවීම සහ වඩාත් තරඟකාරී රටවල් වෙත ඇණවුම් ගලා යෑම හේතු විය. එසේම, නව ඇණවුම් සහ නිෂ්පාදනයෙහි දක්නට ලැබුණු පහත වැටීමට සමගාමීව සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් ද පහත වැටුණි. මෙහිදී, ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යෑමත් සමඟ අමුද්‍රව්‍ය මිල අඛණ්ඩව පහත වැටීමක් අපේක්ෂාවෙන් අවම අමුද්‍රව්‍ය තොගයක් පවත්වාගෙන යන බව බොහෝ ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. මේ අතර, මෙම මාසයේදී ඇණවුම් අඩු වීමත් සමඟ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අඩු විය.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචලයය | අප්‍රේ. | මැයි. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **34.7** | 46.2 | **+** | **අඩු වේගයකින් පහළ යෑමක්** |
| **උපදර්ශක** | | | | |
| නව ඇණවුම් | 33.0 | 48.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 24.5 | 48.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 42.0 | 41.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 25.3 | 43.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 51.5 | 48.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කෙසේ වුවද, ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂා ඉහළ ගොස් ඇත.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 මැයි මාසයේ දී 49.6ක දර්ශක අගයක් වාර්තා කරමින් අප්‍රේල් මාසයේ පැවති අගයෙහිම නොවෙනස්ව පැවතුණි.

පසුගිය මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක චීනය, ඉන්දියාව, සහ රුසියාව යන රටවල වැඩි වේගයකින් ද සිංගප්පූරුවේ අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, සහ එක්සත් ජනපදය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 ජූනි 14 වන දිනට*

---

[1] *එස්&පී ග්ලෝබල්* (S&P Global) *ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පසුගිය මාසයේ දක්නට ලැබුණු සුළු පහත වැටීමෙන් අනතුරුව, 53.5ක දර්ශක අගයක් වාර්තා කරමින් 2023 මැයි මාසයේ දී නැවතත් වර්ධන කලාපයට ළඟා විය.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ ඉහළ යෑම් හේතු විය. කෙසේ වුවද, සේවා නියුක්තිය සහ නිමකිරීමට නියමිත කාර්යයන් මැයි මාසය තුළ දී අඛණ්ඩව පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**53.5**


**2023 මැයි**

සේවා අංශයේ නව ව්‍යාපාර පිළිබඳව සලකා බැලීමේ දී, ප්‍රධාන වශයෙන්, රක්ෂණ, වෘත්තීය සේවා සහ ප්‍රවාහන යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, 2023 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේ දී නව ව්‍යාපාර ඉහළ ගියේය.

බොහෝ උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ අඛණ්ඩව තුන්වන මාසයටත් 2023 මැයි මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනය විය. ඒ අනුව, අනෙකුත් පෞද්ගලික සේවා, රක්ෂණ, වෘත්තීය සේවා සහ සෞඛ්‍ය යන උප අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් යම් වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, උත්සව සමය අවසන් වීමත් සමඟ තොග සහ සිල්ලර වෙළඳාම උප අංශයට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් පහත වැටුණු අතර, සංචාරක පැමිණීම් අඩු වීම මධ්‍යයේ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උප අංශයට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම්ද පහත වැටුණි.

නව බඳවාගැනීම් සුළු වශයෙන් සිදු වුවද, සේවයෙන් ඉවත්වීම්, රැකියා සඳහා විදේශගත වීම් සහ විශ්‍රාම ගැනීම් හේතුවෙන් මැයි මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව වැඩි වේගයකින් පහළ ගියේය. මේ අතර, නිමකිරීමට නියමිත කාර්යයන්ද මෙම මාසය තුළ දී වැඩි වේගයකින් පහළ ගියේය.

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | අප්‍රේ. | මැයි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **49.6** | **53.5** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 47.5 | 59.3 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 51.0 | 57.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 42.5 | 36.6 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 45.7 | 42.2 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 61.1 | 72.1 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් මැයි මාසයේ දී සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, මේ සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ දැමීම සහ රුපියලේ අගය මෑත කාලීනව ඉහළ යෑමත් සමඟ ඉල්ලුම් තත්ත්වයන් වැඩිදියුණු වීම හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම්හි යළි පිබිදීම පිළිබඳ ධනාත්මක ආකල්ප හේතු විය.

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 අප්‍රේල් මාසයේ පැවති 55.4 සිට 2023 මැයි මාසයේ දී 55.5 දක්වා ඉහළ ගියේය.

චීනය, ඉන්දියාව, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2023 මැයි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 ජූනි 14වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.